# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත

---

**[සහතිකය සටහන් කලේ 2001 අගෝස්තු මස 09 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 අගෝස්තු මස 10 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල** : රු. **15.00** යි.　　තැපැල් ගාස්තුව : රු. **5.25** යි.

## 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත

[සහතිකය සටහන් කළේ 2001 අගෝස්තු මස 09 වන දින]

එල්.ඩී.—ඕ. 28/98.

**1980 ඔක්තෝබර් මස 25 වන දින හේග් හි දී සම්මත කර ගන්නා ලද ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ වූ සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිණිස ද, ඔවුන්ගේ සුපුරුදු වාසස්ථානය පිහිටි රටින් නැතහොත් ශ්‍රී ලංකාවෙන් අයුතු ලෙස බැහැරට රැගෙන ගොස් යම් නිශ්චිත රටක හෝ ශ්‍රී ලංකාවේ හෝ රඳවා තබන ලද ළමයින් ආපසු යැවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, අයුතු ලෙස බැහැරට රැගෙන යන ලද ළමයින් ආපසු යැවීම පිළිබඳ ඉල්ලීම් විභාග කිරීම සඳහා පළාත්බද මහාධිකරණවල බල සීමාව පුළුල් කිරීම පිණිස ද, ඒවාට සම්බන්ධ වූ හෝ ආනුෂංගික කරුණු සඳහා ද වූ පනතකි.**

පූර්විකාව.

ජාත්‍යන්තර ළමා අපහරණ පිළිබඳව සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ වූ සම්මුතිය 1980 ඔක්තෝබර් මස 25 වන දින හේග් හි දී සම්මත කරගන්නා ලද හෙයින් ද :

ශ්‍රී ලංකාව ඉහත කී සම්මුතිය පිළිගෙන ඇති හෙයින් ද :

ඉහත කී සම්මුතිය යටතේ වූ ශ්‍රී ලංකාවේ වගකීම් බලාත්මක කිරීම සඳහා නෛතික විධිවිධාන සැලැස්වීමට අවශ්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1980 ඔක්තෝබර් මස 25 වන දින හේග් හි දී අත්සන් කරන ලද (මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර ළමා අපහරණය පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ වූ සම්මුතිය, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක වන දිනය වශයෙන්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන දිනයක දී, මේ පනත ක්‍රියාත්මක විය යුතු ය.

අදාළ වීම.

**2.** මේ පනතේ විධිවිධාන අදාළ විය යුත්තේ කවර රටවල් සම්බන්ධයෙන් ද යන්න සහ එසේ ඒ විධිවිධාන අදාළ වීම බලාත්මක වන්නේ කවර දිනයක සිට ද යන්න, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ නියමයක් කරන ලද්දේ යම් රටක් සම්බන්ධයෙන් ද ඒ රට මෙහි මින් මතු "නිශ්චිත රටක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

2— H 010721— 4,400 (2001/02)

අයුතු ලෙස රැගෙන ඒම හෝ රඳවා තබා ගැනීම.

**3.** (1) (අ) අවස්ථාවෝචිත පරිදි, ළමයකු ශ්‍රී ලංකාවට රැගෙන ඒම හෝ ශ්‍රී ලංකාවෙහි රඳවා තබා ගැනීම, ඒ ළමයා එසේ රැගෙන ඒම හෝ රඳවා තබා ගැනීමට පෙරාතුව ම, ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටෙහි නීතිය යටතේ යම් තැනැත්තකුට හෝ ආයතනයකට හෝ වෙනත් පුද්ගල මණ්ඩලයකට, එක්ව හෝ තනි තනිව හෝ ආරෝපිත, භාරකාරත්වය පිළිබඳ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන අවස්ථාවක ;

(ආ) අවස්ථාවෝචිත පරිදි බැහැරට රැගෙන යාම හෝ රඳවා තබා ගැනීම සිදු කරන කාලයේ දී ඒ අයිතිවාසිකම් ඒ තැනැත්තා, ආයතනය හෝ වෙනත් පුද්ගල මණ්ඩලය විසින් එක්ව හෝ තනි තනිව හෝ නියම වශයෙන්ම ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවක, නැතහොත් අවස්ථාවෝචිත පරිදි එසේ රැගෙන ඒම හෝ රඳවා තබා ගැනීම හෝ නොවන්නට ඒ තැනැත්තා, ආයතනය හෝ වෙනත් පුද්ගල මණ්ඩලය විසින්, ඒ අයිතිවාසිකම් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිව තිබුණු අවස්ථාවක,

ළමයකු ශ්‍රී ලංකාවට රැගෙන ඒම හෝ ශ්‍රී ලංකාව තුළ රඳවා තබා ගැනීම, මේ පනතේ කාර්ය සඳහා අයුතු ක්‍රියාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති භාරකාරත්වය පිළිබඳ අයිතිවාසිකම් යන්නට, අවස්ථාවෝචිත පරිදි, ළමයකු රැගෙන ඒමට හෝ රඳවා තබා ගැනීමට පෙර ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය පිහිටි යම් නිශ්චිත රටක—

(අ) නීතිය ක්‍රියාත්මක වීමෙන් ;

(ආ) අධිකරණමය හෝ පරිපාලනමය තීරණයක් හේතුවෙන් ; හෝ

(ඇ) නීතිය යටතේ නීත්‍යනුකූල බලපෑමක් ඇති යම් ගිවිසුමක් හේතුවෙන්,

පැන නඟින යම් භාරකාරත්වය පිළිබඳ අයිතිවාසිකම් ඇතුළත් වේ.

මධ්‍යම බලධරයා.

**4.** අධිකරණ විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "මධ්‍යම බලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මධ්‍යම බලධරයා වන්නේ ය.

මධ්‍යම බලධරයාගේ කාර්ය.

**5.** මධ්‍යම බලධරයා විසින්, කෙලින්ම හෝ අන්තරිකයකු මගින් හෝ,—

(අ) අයුතු ලෙස ශ්‍රී ලංකාවට රැගෙන එන ලද හෝ ශ්‍රී ලංකාව තුළ රඳවා තබා ගන්නා ලද ළමයකුගේ පදිංචිය සොයා ගැනීමට ;

(ආ) අවශ්‍ය විය හැකි බව පෙනී යන යම් යාවකාලීන පියවර ගැනීමෙන් හෝ ගැනීමට සැලැස්වීමෙන්, එවැනි යම් ළමයකුට තවදුරටත් හානි සිදුවීම වැළැක්වීමට නැතහොත් එහි ලා සම්බන්ධතාවක් දක්වන වෙනත් යම් පාර්ශවකරුවන්ට හානියක් සිදුවීම වැළැක්වීමට ;

(ඇ) එවැනි යම් ළමයකු ඔහුගේ හෝ ඇයගේ පුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ස්වේච්ඡාවෙන් ආපසු යැවීම සුරක්ෂිත කිරීමට, නැතහොත් එවැනි යම් ළමයකු ශ්‍රී ලංකාවට අයුතු ලෙස රැගෙන ආ බව හෝ ශ්‍රී ලංකාව තුළ අයුතු ලෙස රඳවා තබා ගත් බව කියා සිටින යම් තැනැත්තකු සහ, එවැනි ළමයකු ඔහුගේ හෝ ඇයගේ පුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටට ආපසු යැවීමට විරුද්ධ වන තැනැත්තකු අතර ඇති මතභේදයන්ට මිත්‍රශීලී එකඟත්වයක් ඇති කිරීමට ;

(ඈ) අභිමත අවස්ථාවල දී, නිශ්චිත රටක උචිත බලධරයන් සමග, එවැනි ළමයකු සම්බන්ධ අදාළ තොරතුරු හුවමාරු කර ගැනීමට ;

(ඉ) යම් නිශ්චිත රටක සම්මුතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නීතියේ සාමාන්‍ය ස්වරූපය පිළිබඳ තොරතුරු ඉල්ලීමක් කරනු ලැබූ විට සැපයීමට ;

(ඊ) යම් ළමයකු ඒ ළමයාගේ පුරුදු වාසස්ථානය ඇති රටට ආපසු යැවීමේ අරමුණින්, අධිකරණමය ක්‍රියාමාර්ගයක් ගැනීමට සහ උචිත අවස්ථාවල දී,

ශ්‍රී ලංකාව තුළ සිටින ළමයකු වෙත ප්‍රවේශ අයිතිවාසිකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, සංවිධානය කිරීම හෝ සුරක්ෂිත කිරීම හෝ සුරක්ෂිත කිරීම අරඹයා අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම පිණිස, වැඩපිළිවෙලවල් සකස් කිරීමට ;

(උ) අවස්ථාගත කරුණු අනුව අවශ්‍ය වන අවස්ථාවක, නීති ආධාර හෝ උපදෙස් සැපයීම පහසු කිරීමට ;

(ඌ) එවැනි යම් ළමයකු ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටට සුරක්ෂිතව ආපසු යැවීම සඳහා, අවශ්‍ය විය හැකි හා උචිත පරිපාලනමය වැඩපිළිවෙලවල් සැලසීමට,

යෝග්‍ය සියලුම පියවර ගනු ලැබිය හැකි ය.

අයුතු ලෙස බැහැරට රැගෙන යන ලද හෝ රඳවා තබන ලද ළමයකු ආපසු යැවීම සුරක්ෂිත කිරීමට සහාය ලබා ගැනීම සඳහා මධ්‍යම බලධරයාගෙන් ඉල්ලීමක් කිරීම.

**6.** (1) භාරකාරත්වය පිළිබඳ අයිතිවාසිකම් කඩ කරමින්, ළමයකු, ශ්‍රී ලංකාවට අයුතු ලෙස රැගෙන එන ලද බව හෝ ශ්‍රී ලංකාව තුළ රඳවා තබන ලද බව කියා සිටින, නිශ්චිත රටක උචිත බලධරයකු හෝ තැනැත්තකු හෝ ආයතනයක් හෝ වෙනත් මණ්ඩලයක් විසින්, ඒ ළමයා ආපසු ගෙන්වා ගැනීම සුරක්ෂිත කර ගැනීම සඳහා සහාය ලබා ගැනීම පිණිස ඉල්ලීමක්, මධ්‍යම බලධරයා වෙත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක් ම, මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු අතර, වෙනත් කරුණු අතර —

(අ) ඉල්ලුම්කරු, ළමයා සහ ළමයා බැහැරට ගෙන යාම හෝ රඳවා තැබීම කරන ලදැයි කියනු ලබන තැනැත්තා හඳුනා ගැනීමට අදාළ තොරතුරු ද ;

(ආ) ලබා ගත හැකි අවස්ථාවක, ළමයාගේ උපන් දිනය ද ;

(ඇ) ළමයා ආපසු ගෙන්වා ගැනීමට ඉල්ලා සිටීමේ දී ඉල්ලුම්කරු විසින් පාදක කරගත් කරුණු ද ;

(ඈ) ළමයාගේ පදිංචියට අදාළ සියලු තොරතුරු සහ ළමයා රඳවා තබනු ලැබ ඇතැයි විශ්වාස කරනු ලබන තැනැත්තා හඳුනා ගැනීමට අදාළ සියලු තොරතුරු ද ;

ඇතුළත් විය යුතු අතර,—

(i) කඩ කරන ලදැයි කියා සිටින භාරකාරත්වය පිළිබඳ අයිතිවාසිකම් ඇති කරන්නා වූ යම් අදාළ තීරණයක හෝ ගිවිසුමක, යථා පරිදි සැබෑ බවට සහතික කරන ලද පිටපතක් ;

(ii) ඒ ළමයාගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටේ උචිත බලධරයාගෙන් නැතහොත් සුදුසුකම් ලත් තැනැත්තකුගෙන්, කඩ කිරීම කරන ලදැයි කියනු ලබන භාරකාරත්වය පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ වන්නා වූ එම නිශ්චිත රටෙහි නීතිය දක්වන සහතිකයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් ;

(iii) අදාළ වෙනත් යම් ලේඛනයක්,

සමග ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමකම සහ ඒ ඉල්ලීම සමග ඉදිරිපත් කරනු ලබන ලේඛනවල, සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි පරිවර්තන තිබිය යුතු ය.

**7.** 6 වන වගන්තිය යටතේ මධ්‍යම බලධරයා වෙත කරන ලද ඉල්ලීමක් භාර ගැනීම, එය කරනු ලැබීමට හේතු නොමැති බවට බලධරයා සෑහීමකට පත්වන්නේ නම්, ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. ඉල්ලීමක් භාර ගැනීම ඔහු විසින් ප්‍රතික්ෂේප කිරීමේ දී, මධ්‍යම බලධරයා විසින්, ඉල්ලීම කරනු ලබන උචිත බලධරයා වෙත, ප්‍රතික්ෂේප කිරීමට හේතු වහාම දැනුම් දිය යුතු ය. මධ්‍යම බලධරයා විසින් ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි බව.

**8.** 6 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුනු අවස්ථාවක, එම ඉල්ලීම කරනු ලබන්නේ යම් ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා වෙනත් නිශ්චිත රටක සිටින බවට මධ්‍යම බලධරයාට විශ්වාස කිරීමට හේතු ඇති විට, මධ්‍යම බලධරයා විසින් ඒ නිශ්චිත රටේ උචිත බලධරයා වෙත ඒ ඉල්ලීම වහාම ප්‍රේෂණය කළ යුතු අතර, ඉල්ලීම කරන ලද උචිත බලධරයා වෙත ඔහු එසේ කළ බව වහාම දැනුම් දිය යුතු ය. ඇතැම් අවස්ථාවල දී මධ්‍යම බලධරයා විසින් වෙනත් නිශ්චිත රටක උචිත බලධරයා වෙත ඉල්ලීම් ප්‍රේෂණය කිරීම.

මධ්‍යම බලධරයා විසින් ආපසු යැවීමේ ආඥාවක් ලබා ගැනීම පිණිස ඉල්ලීමක් මහාධිකරණය වෙත කරනු ලැබිය හැකි බව.

**9.** (1) ආපසු ගෙන්වා ගැනීම සුරක්ෂිත කරන්නා වූ වෙනත් යම් ක්‍රියාමාර්ගයන්ට හානියක් නොවන පරිදි 6 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබ ඇත්තේ යම් ළමයකු සම්බන්ධයෙන් ද, ඒ ළමයා ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ආපසු යැවීම සඳහා ආඥාවක් ලබා ගැනීම පිණිස වූ ඉල්ලීමක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග. ව්‍යවස්ථාව යටතේ බස්නාහිර පළාත සඳහා පිහිටුවා ඇති මහාධිකරණය වෙත, මධ්‍යම බලධරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන සෑම ඉල්ලීමක්ම ලසු ආකාරයෙන් කරනු ලැබිය යුතු අතර, 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත යටතේ වූ මුද්දර ගාස්තු ගෙවීමකින් නිදහස් විය යුතු ය.

මහාධිකරණය විසින් ළමයකු ආපසු යැවීමට ආඥාවක් කරනු ලැබිය හැකි බව.

**10.** 9 වන වගන්තිය යටතේ මහාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණය විසින් සෑහීමට පත් වන අවස්ථාවක, මහාධිකරණය විසින් 11 වන වගන්තියට යටත් ව,—

(අ) ඉල්ලීම කරනු ලැබ ඇත්තේ යම් ළමයකු සම්බන්ධයෙන් ද, ඒ ළමයා 3 වන වගන්තියේ අර්ථානුකූලව, අවස්ථාවෝචිත පරිදි, අයුතු ලෙස, ශ්‍රී ලංකාවට රැගෙන ආ බව හෝ ශ්‍රී ලංකාව තුළ රඳවා තබා ගන්නා ලද බව ; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, රැගෙන ඒම හෝ රඳවා තබා ගැනීම කරන ලදැයි කියනු ලබන දිනය සහ ඒ ඉල්ලීමේ දිනය අතර අවුරුදු එකකට අඩු කාල සීමාවක් ඉකුත් වී ඇති බව,

සම්බන්ධයෙන් මහාධිකරණය සෑහීමකට පත්වන අවස්ථාවක, ඒ ළමයාගේ සුපුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටට ඔහු හෝ ඇය ආපසු යැවීම සඳහා ආඥාවක් වහාම කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, ළමයකු ඔහුගේ හෝ ඇයගේ නව පරිසරයේ ස්ථිරව පදිංචිව සිටින බවට සෑහීමකට පත් වුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, රැගෙන ඒම හෝ රඳවා තබා ගැනීම කරන ලදැයි කියනු ලබන දිනය සහ ඉල්ලීම කරන ලද දිනය

අතර අවුරුද්දු එකකට වඩා වැඩි කාලයක් ඉකුත් වී තිබුන ද, මහාධිකරණය විසින්, ඒ ළමයා ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ආපසු යැවීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

මහාධිකරණය විසින් 10 වන වගන්තිය යටතේ වන ආඥාවක් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතු.

**11.** (1) ළමයකු ආපසු යැවීමට විරුද්ධ වන තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින්—

(අ) අවස්ථාවෝචිත පරිදි, එසේ රැගෙන ඒම හෝ රඳවා තබා ගැනීම කරනු ලැබූ කාලයේ දී, ළමයාගේ ශාරීරික රැකවරණය ඇතිව සිටින තැනැත්තා, ආයතනය හෝ පුද්ගල මණ්ඩලය විසින් ඒ භාරකාරත්ව අයිතිය ක්‍රියාත්මක නොකරන බව හෝ අවස්ථාවෝචිත පරිදි එසේ රැගෙන ඒමට හෝ රඳවා තබා ගැනීමට කැමැත්ත දී ඇති බවට හෝ පසුව එකඟ වී ඇති බවට; නැතහොත්

(ආ) ඒ ළමයා ආපසු යැවීමෙන් ඒ ළමයා ශාරීරික හෝ මානසික පීඩාවකට භාජනය වීමේ හෝ අත්‍යාකාරයකින් ඉවසිය නොහැකි තත්වයකට පත්වීමේ බරපතල අවදානමක් ඇති බවට,

මහාධිකරණය සෑහීමකට පත් කරනු ලැබුවහොත් ළමයකු ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය පිහිටි රටට ආපසු යැවීම සඳහා, 10 වන වගන්තිය යටතේ වන ආඥාවක් කිරීම මහාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) ළමයකු ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ආපසු යවනු ලැබීමට ඒ ළමයා විරුද්ධ වන්නේ නම් සහ ඒ ළමයාගේ මතය සැලකිල්ලට ගැනීම උචිත වන වයසකට හා පරිනත තත්ත්වයකට ඒ ළමයා පත්ව ඇති බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම්, මහාධිකරණය විසින් 10 වන වගන්තිය යටතේ ළමයකු ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ආපසු යැවීම සඳහා ආඥාවක් කිරීම, ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ, මහාධිකරණය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ළමයකුගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටේ උචිත බලධරයා විසින් සපයනු ලබන, ඒ ළමයාගේ සමාජ පසුබිම පිළිබඳ තොරතුරු සැලකිල්ලට ගත යුතු ය.

(4) මහාධිකරණය විසින්, ළමයකු ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටට ආපසු යැවීම සඳහා, 10 වන වගන්තිය යටතේ වන ආඥාවක් කිරීම, ඒ ළමයාගේ භාරකාරත්වයට අදාළව, ශ්‍රී ලංකාවේ අධිකරණයක තීරණයක් බලාත්මකව පැවතීම හෝ ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් පිළිගැනීමට හිමිකම් ලබන යම් තීරණයක් පැවතීම යන හේතු මත පමණක්ම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු නමුත්, මහාධිකරණය විසින් 10 වන වගන්තිය යටතේ ආඥාවක් කිරීමේ දී, එවැනි තීරණයකට එළඹීමෙහි ලා වූ හේතු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

ඉල්ලීමක් පිළිබඳ සුදුස්සක් කිරීමට ප්‍රමාදවීම පිළිබඳව මධ්‍යම බලධරයා විසින් අධිකරණයෙන් හේතු විමසනු ලැබිය හැකි බව.

**12.** (1) 9 වන වගන්තිය යටතේ ළමයකු ආපසු යැවීමේ ඉල්ලීමක් කවර හෝ මහාධිකරණයක් වෙත කරනු ලැබ, ඒ මහාධිකරණය විසින්, ඒ ඉල්ලීම කරන ලද දිනයේ සිට සති හයක් ඇතුළත, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම පැහැර හරින ලද අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින්—

(අ) ස්වකීය මෝසමක් මත ; හෝ

(ආ) ඒ ළමයාගේ සුපුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටේ උචිත බලධරයාගේ ඉල්ලීම මත ; හෝ

ප්‍රමාදයට හේතු මහාධිකරණයෙන් විමසනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම බලධරයා විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාරයක් වශයෙන් පිළිතුරක් ලැබුන අවස්ථාවක, ඔහු විසින්, ඒ ළමයාගේ සුපුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටේ උචිත බලධරයා වෙත, ඒ පිළිතුර ප්‍රේෂණය කිරීමට සැලැස්විය යුතු ය.

ප්‍රවේශ වීමේ අයිතිය හා බලය.

**13.** (1) නිශ්චිත රටක උචිත බලධරයෙක් හෝ තැනැත්තෙක් හෝ ආයතනයක් හෝ වෙනත් මණ්ඩලයක් හෝ විසින්, ඉල්ලීමේ නිශ්චිතව සඳහන් කර ඇති තැනැත්තකු සතුව ඇති ශ්‍රී ලංකාව තුළ සිටින ළමයකු කෙරෙහි ප්‍රවේශ වීමේ අයිතිය, සාර්ථකව ක්‍රියාත්මක කිරීම සුරක්ෂිත කිරීමට සහාය ලබා ගැනීම පිණිස ඉල්ලීමක්, මධ්‍යම බලධරයා වෙත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක, වෙනත් දේ අතර—

(අ) ඉල්ලුම්කරුගේ, ළමයාගේ සහ ශ්‍රී ලංකාව තුළ දී ළමයාගේ භාරකාරත්වය ඇතිව සිටින්නා වූ තැනැත්තාගේ අනන්‍යතාව හඳුනා ගැනීමට අදාළ තොරතුරු ;

(ආ) ලබා ගත හැකි අවස්ථාවක, ළමයාගේ උපන් දිනය ;

(ඇ) ඉල්ලුම්කරු විසින් ප්‍රවේශවීමේ අයිතිය ඉල්ලා සිටීමට පදනම් කරගත් හේතු ; සහ

(ඈ) ළමයාගේ පදිංචියට අදාළව සහ ළමයා නැවතී සිටින බවට විශ්වාස කරන කවර හෝ තැනැත්තකු පිළිබඳව ලබා ගත හැකි සියලුම තොරතුරු,

ඇතුළත් විය යුතු අතර —

(i) ළමයා කෙරෙහි ප්‍රවේශ අයිතියක් ඇති කෙරෙන, අදාළ අධිකරණ තීරණයේ හෝ ගිවිසුමේ, යථා පරිදි සැබෑ බවට සහතික කරන ලද පිටපතක් ;

(ii) ඒ ළමයාගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටේ උචිත බලධරයාගෙන් හෝ සුදුසුකම් ලත් තැනැත්තකුගෙන්, ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටින අයිතිවාසිකම්වලටම අදාළ ඒ නිශ්චිත රටෙහි නීතිය පිළිබඳව සහතිකයක් හෝ දිවුරුම් ප්‍රකාශයක්,

ඒ ඉල්ලීම සමඟ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන සියලුම ඉල්ලීම්වල සහ ඒ ඉල්ලීම් සමඟ ඉදිරිපත් කරන ලේඛනවල, සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවට කරන ලද පරිවර්තන තිබිය යුතු ය.

මධ්‍යම බලධරයා විසින් ප්‍රවේශ වීමේ ආඥාවක් ලබා ගැනීම පිණිස අධිකරණයට ඉල්ලීමක් කරනු ලැබිය හැකි බව.

**14.** (1) ශ්‍රී ලංකාව තුළ සිටින ළමයකු කෙරෙහි, යම් තැනැත්තකුට ඇති ප්‍රවේශ වීමේ අයිතිය ක්‍රියාත්මක කිරීම සුරක්ෂිත කරන්නා වූ වෙනත් යම් ක්‍රියා මාර්ගයන්ට අගතියක් නොවන පරිදි, ඒ අයිතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම ඵලදායි ලෙස සුරක්ෂිත කරන්නා වූ අධිකරණ ආඥාවක් ලබා ගැනීම පිණිස ඉල්ලීමක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ බස්නාහිර පළාත සඳහා පිහිටුවා ඇති මහාධිකරණය වෙත, මධ්‍යම බලධරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන සෑම ඉල්ලීමක්ම ලඝු ආකාරයෙන් කරනු ලැබිය යුතු අතර, 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත යටතේ වූ යම් මුද්දර ගාස්තු ගෙවීමකින් නිදහස් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ මහාධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මගින්, ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් ළමයා වෙත ප්‍රවේශ අයිතියක්, ඉල්ලීම කරන ලද තැනැත්තා සතුව, නැතහොත් ඒ ඉල්ලීම කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා සතුව ඇති බවට මහාධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, මහාධිකරණය විසින් ඒ ප්‍රවේශ අයිතිවාසිකම් සහ ඒ අයිතිවාසිකම් යටත් වන කොන්දේසි කිසිවක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සුරක්ෂිත කිරීම පිණිස, අවශ්‍ය යම් ආඥා කරනු ලැබිය හැකි ය.

සාක්ෂි.

**15.** (1) අවස්ථාවෝචිත පරිදි, ළමයකු ආපසු යැවීම සඳහා හෝ ළමයකු කෙරෙහි ප්‍රවේශ වීම සඳහා හෝ, අවස්ථාවෝචිත පරිදි 9 වන වගන්තිය හෝ 14 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් විභාග කිරීමේ දී, 6 වන වගන්තිය හෝ 13 වන වගන්තිය යටතේ ළමයකු සම්බන්ධයෙන් මධ්‍යම බලධරයාට කරන ලද ඉල්ලීමක් සහ ඒ සමඟ ඉදිරිපත් කර ඇති ලේඛන, අත්සන ඔප්පු කිරීමකින් තොරව, සාක්ෂි ලෙස පිළිගත හැකි අතර, ප්‍රතිවිරුද්ධ කරුණු ඔප්පු කරන තෙක්, ඒවායේ ඇති කරුණු ඔප්පු කරන ලද ලෙස සැලකිය යුතු ය.

(2) 9 වන වගන්තිය යටතේ ළමයකු ආපසු යැවීම සඳහා කරන ලද ඉල්ලීමක් විභාග කිරීමේ දී, මහාධිකරණය විසින්, ළමයකු ශ්‍රී ලංකාවට රැගෙන ඒම හෝ ශ්‍රී ලංකාව තුළ රඳවා තබා ගැනීම, 3 වන වගන්තියේ අර්ථානුකූලව, අයුතු ක්‍රියාවක් වන්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා, ඒ ළමයාගේ පුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටේ අදාළ නීතිය හා අධිකරණ තීරණ පිළිබඳව අධිකරණමය පිළිගැනීමක් කළ යුතු ය.

මහාධිකරණය විසින්, නිශ්චිත රටේ අදාළ බලධරයන්ගෙන් තියෝග ලබා ගැනීමට, මධ්‍යම බලධරයාට නියම කරනු ලැබිය හැකි බව.

**16.** 10 වන වගන්තිය යටතේ ළමයකු ඔහුගේ හෝ ඇයගේ වාසස්ථානය පිහිටි නිශ්චිත රටට ආපසු යැවීම සඳහා ආඥාවක් කිරීමට පෙර, මහාධිකරණය විසින්, ඒ ළමයා ශ්‍රී ලංකාවට රැගෙන ඒම හෝ ශ්‍රී ලංකාව තුළ රඳවා තබා ගැනීම, සම්මුතියේ අර්ථානුකූලව, අයුතු ක්‍රියාවක් වන්නේ ද යන්න පිළිබඳ තීරණයක් හෝ නිශ්චය කිරීමක්, ඒ ළමයාගේ පුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටේ අදාළ බලධරයන්ගෙන් ලබා ගැනීමට, මධ්‍යම බලධරයාට නියම කරනු ලැබිය හැකි ය.

**17.** මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක හෝ සඳහන් කිසිවක් මගින්, 9 වන වගන්තිය හෝ 14 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක වගඋත්තරකරුවකු විසින් දරන ලද හෝ දරන ලදැයි සිතිය හැකි හෝ යම් ගාස්තු ගෙවීමක් වෙනුවෙන් ඇප තැබීමට හෝ එවැනි යම් ඉල්ලීමක් වෙනුවෙන් ගාස්තු ගෙවීමට හෝ, මධ්‍යම බලධරයා වෙත ආඥා කිරීමට, මහාධිකරණය බලය දෙනු ලැබූ ලෙස සැලකිය යුතු නොවන්නේ ය.

ගාස්තු ගෙවීමක් වෙනුවෙන් ඇප තැබීමට මධ්‍යම බලධරයාට නියම කරනු ලැබිය නොහැකි බව.

**18.** මහාධිකරණය විසින්, යම් ළමයකු ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ආපසු යැවීම සඳහා 10 වන වගන්තිය යටතේ ආඥාවක් කිරීමෙන් පසුව, ඒ ළමයාට නවාතැන් දීම සඳහා ද, මධ්‍යම බලධරයා විසින් නීතිමය නියෝජිතත්වය ලබා ගැනීම සඳහා ද, ඒ ළමයා ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ආපසු යැවීම සඳහා ද, දරන ලද වියදම් ඇතුළුව මධ්‍යම අධිකාරිය විසින් දරන ලද සියලු වියදම් ගෙවීමට ආඥාවක්, ඒ ළමයා ශ්‍රී ලංකාව වෙත බැහැර කරන ලද හෝ ශ්‍රී ලංකාව තුළ රඳවා තබා ගත් තැනැත්තා වෙත කරනු ලැබිය හැකි ය.

මධ්‍යම බලධරයා විසින් දරන ලද වියදම් ගෙවීමට, මහාධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි බව.

**19.** මහාධිකරණය විසින්, 10 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක්, ඒ ආඥාව අදාළ වන්නා වූ ළමයාගේ භාරකාරත්වයට අදාළ යම් ප්‍රශ්නයක් පිළිබඳව, යෝග්‍යතාව මත දෙන ලද තීරනයක් හෝ නිශ්චය කිරීමක් ලෙස සැලකිය යුතු නොවන්නේ ය.

10 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් කුසලතාව මත දුන් තීරණයක් හෝ නිශ්චය කිරීමක් නොවන බව.

**20.** ළමයකු නිශ්චිත රටකින් ශ්‍රී ලංකාවට අයුතු ලෙස රැගෙන එන ලද බවට දැනුම් දීමක් මධ්‍යම බලධරයා වෙත ලැබුණු අවස්ථාවක—

(අ) ඒ ළමයා නිශ්චිත රටට ආපසු යැවීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, 6 වන වගන්තිය යටතේ හෝ 9 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක්, මධ්‍යම බලධරයා විසින් හෝ ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන තෙක්, ; හෝ

(ආ) ඒ දැනුම් දීමේ දින සිට සති හයක කාලයක් ඉකුත් වනතුරු හා පසුව ද, ඒ ළමයා නිශ්චිත රටට ආපසු යැවීම සඳහා 6 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු නොලබන තෙක්,

ශ්‍රී ලංකාවේ කිසිම අධිකරණයක් විසින්, ඒ දැනුම් දීමට අදාළ වන්නා වූ ළමයාගේ භාරකාරත්වය හා සම්බන්ධ කිසිම ප්‍රශ්නයක්

අයුතු ලෙස ශ්‍රී ලංකාව වෙත රැගෙන එන ලද ළමයකුගේ භාරකාරත්වයට අදාළ වන ප්‍රශ්න පිළිබඳ තීරණය කිරීමට හෝ නිශ්චය කිරීමට අධිකරණයට ඇති අධිකරණ බලය.

පිළිබඳව, කුසලතාව මත තීරණයක් හෝ නිශ්චය කිරීමක් කරනු නොලැබිය යුතු ය.

10 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබීමට අදාළ වන්නා වූ කවර හෝ ළමයකු ආපසු යැවීම සඳහා මධ්‍යම බලධරයා විසින් කටයුතු පිළියෙල කළ යුතු බව.

**21.** ළමයකු ඔහුගේ හෝ ඇයගේ සුපුරුදු වාසස්ථානය ඇති නිශ්චිත රටට ආපසු යැවීම සඳහා, 10 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ළමයා ඒ නිශ්චිත රටට ආපසු යැවීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු ආඥාවට අනුකූලව පිළියෙල කිරීමට, මධ්‍යම බලධරයා විසින් සැලැස්විය යුතු ය.

නිශ්චිත රටකට අයුතු ලෙස රැගෙන යන ලද හෝ නිශ්චිත රටක් තුළ අයුතු ලෙස රඳවා තබන ලද ළමයකු ආපසු ගෙන්වා ගැනීම සුරක්ෂිත කිරීම සඳහා තැනැත්තෙක්, ආයතනයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් පුද්ගල බලධරයා වෙත ඉල්ලීමක් කළ හැකි බව.

**22.** (1) ශ්‍රී ලංකාවේ යම් තැනැත්තෙක්, ආයතනයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් විසින්, ඒ තැනැත්තාගේ, ආයතනයේ හෝ වෙනත් පුද්ගල මණ්ඩලයේ භාරකාරත්ව අයිතිවාසිකම් කඩ කරමින්, ළමයකු යම් නිශ්චිත රටකට අයුතු ලෙස රැගෙන ගොස් ඇති බව හෝ නිශ්චිත රටක අයුතු ලෙස රඳවා තබා ඇති බව කියා සිටින විටක, ඒ ළමයා ආපසු ගෙන්වා ගැනීම සුරක්ෂිත කර ගැනීම සඳහා, මධ්‍යම බලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක් ලැබුණු විට, මධ්‍යම බලධරයා විසින්, ඒ ළමයා රැගෙන ගොස් ඇතැයි හෝ රඳවා තබා ඇතැයි කියනු ලබන නිශ්චිත රටේ උචිත බලධරයා වෙත උචිත අයුරකින්, ඒ ළමයා ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සුරක්ෂිත කර ගැනීමට සහාය ලබා ගැනීම පිණිස ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වන 'භාරකාරත්ව අයිතිවාසිකම්' යන්නට, ශ්‍රී ලංකාවේ—

(අ) නීතිය ක්‍රියාත්මක වීමෙන් ; හෝ

(ආ) අධිකරණයක හෝ විනිශ්චය සභාවක තීන්දුවක් හෝ ආඥාවක් හේතුවෙන් ; හෝ

(ඇ) නීතිය යටතේ නීත්‍යානුකූල බලපෑමක් ඇති යම් ගිවිසුමක් හේතුවෙන්,

යම් තැනැත්තකුට, ආයතනයකට හෝ වෙනත් පුද්ගල මණ්ඩලයකට උපචිත වන්නා වූ භාරකාරත්ව අයිතිවාසිකම් ඇතුළත් වේ.

**23.** නිශ්චිත රටක උචිත බලධරයෙක් විසින් හෝ උචිත බලධරයෙක් වෙනුවෙන් හෝ කරන ලද ඉල්ලීමක් මත, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ බස්නාහිර පළාත සඳහා පිහිටුවා ඇති මහාධිකරණය විසින්, ඒ නිශ්චිත රට වෙත ළමයකු රැගෙන යාම හෝ ඒ නිශ්චිත රට තුළ ළමයකු රඳවා තබා ගැනීම, සම්මුතියේ 3 වන වගන්තියේ අර්ථානුකූලව අයුතු ක්‍රියාවක් වන බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. ඇතැම් ප්‍රකාශයක් කිරීමට මහාධිකරණයට ඇති අධිකරණ බලය.

**24.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**25.** (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ— අර්ථ නිරූපණය.

'ළමයා' යන්නෙන්, වයස අවුරුදු දහසයට පත් නොවූ තැනැත්තෙක් අදහස් වේ ;

'ප්‍රවේශ වීමේ අයිතිවාසිකම්' යන්නට, ළමයකු සම්බන්ධයෙන් වන විට, ළමයකු සීමාසහිත කාලයකට ළමයාගේ පුරුදු වාසස්ථානය නොවන්නා වූ ස්ථානයකට ගෙන යාමට ඇති අයිතිවාසිකම ද ඇතුළත් වේ ;

'භාරකාරත්ව අයිතිවාසිකම්' යන්නට, ළමයකු සම්බන්ධයෙන් වන විට, ළමයාගේ පුද්ගල භාරකාරත්වයට අදාළ අයිතිවාසිකම් සහ විශේෂයෙන් ළමයාගේ පදිංචි ස්ථානය නිශ්චය කිරීමට ඇති අයිතිවාසිකම ද ඇතුළත් වේ ;

(2) යම් නිශ්චිත රටක ළමයින්ගේ භාරකාරත්වය පිළිබඳ කාරණවල දී, ඒ නිශ්චිත රටේ විවිධ ප්‍රාදේශීය ඒකකවල අදාළ

වන නීති ක්‍රම දෙකක් හෝ ඊට වැඩිගණනක් පවත්නා අවස්ථාවක—

(අ) මේ පනතේ, 'ඒ නිශ්චිත රටේ සුපුරුදු වාසස්ථානය' යනුවෙන් කර ඇති සඳහන් කිරීම්, ඒ නිශ්චිත රටේ ප්‍රාදේශීය ඒකකයක සුපුරුදු වාසස්ථානය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය ; සහ

(ආ) මේ පනතේ, 'ඒ ළමයාගේ සුපුරුදු වාසස්ථානය පිහිටි නිශ්චිත රටේ නීතිය' යනුවෙන් කර ඇති සඳහන් කිරීම්, ඒ නිශ්චිත රටේ ළමයාගේ සුපුරුදු වාසස්ථානය පිහිටි ප්‍රාදේශීය ඒකකයේ නීතිය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

(3) යම් නිශ්චිත රටක ළමයින්ගේ භාරකාරත්වය පිළිබඳ කරුණුවල දී, ඒ නිශ්චිත රටේ වෙනස් පුද්ගල කාණ්ඩවලට නීති ක්‍රම දෙකක් හෝ ඊට වැඩි ගණනක් යොදා ගන්නා අවස්ථාවක, ''ඒ නිශ්චිත රටේ නීතිය'' යනුවෙන් මේ පනතේ කර ඇති සඳහන් කිරීම්, ඒ යොදා ගන්නා නීති ක්‍රමය පිළිබඳ සඳහන් කිරීම් ලෙස කියවීම හා තේරුම් ගැනීම කළ යුතු ය.

උපලේඛනය [6(2) වගන්තිය]

**ඉල්ලුම්පත්‍ර ආකෘතිය**

ඉල්ලා සිටීමේ මධ්‍යම බලධරයා හෝ ඉල්ලුම්කරු ඉල්ලා සිටීමේ බලධරයා

........................ දිනට අවු : දහසයක් සම්පූර්ණ වන ........................ යන පහත දැක්වෙන ළමයාගේ විස්තර :—

## 1. ළමයාගේ සහ ළමයාගේ දෙමව්පියන්ගේ අනන්‍යතාවය

### 1 ළමයා

නම සහ මුල් නම් : ............................................................

උපන් ස්ථානය හා දිනය :....................................................

රැගෙන යාම හෝ රඳවා තබා ගැනීමට පෙර සුපුරුදු වාසස්ථානය :............................................................

ගුවන් ගමන් බලපත්‍රයක් හෝ හැඳුනුම්පතක් තිබේ නම් එහි අංකය : ............................................................

ලබාගත හැකි නම් විස්තරය සහ ජායාරූපය (ඇමුණුම බලන්න) : ............................................................

### 2. දෙමව්පියන්

2.1 මව : නම සහ මුල් නම් : ..............................................

උපන් ස්ථානය හා දිනය : .....................................

ජාතිය : ............................................................

වෘත්තිය : ............................................................

සුපුරුදු වාසස්ථානය : ..............................................

ගමන් බලපත්‍රය හෝ හැඳුනුම්පතක් ඇත්නම් එහි අංකය : ................................

2.2 පියා : නම සහ මුල් නම් : ..............................................

උපන් දිනය හා ස්ථානය : .....................................

ජාතිය : ............................................................

# 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත

උපලේඛනය [6(2) වගන්තිය]

**ඉල්ලුම්පත්‍ර ආකෘතිය**

ඉල්ලා සිටීමේ මධ්‍යම බලධරයා හෝ ඉල්ලුම්කරු ඉල්ලා සිටීමේ බලධරයා

…………………… දිනට අවු : දහසයක් සම්පූර්ණ වන …………………… යන පහත දැක්වෙන ළමයාගේ විස්තර :—

## 1. ළමයාගේ සහ ළමයාගේ දෙමව්පියන්ගේ අනන්‍යතාවය

### 1 ළමයා

නම සහ මුල් නම් : ……………………………………………………

උපන් ස්ථානය හා දිනය :……………………………………………

රැගෙන යාම හෝ රඳවා තබා ගැනීමට පෙර පුරුදු වාසස්ථානය :……………………………………………………

ගුවන් ගමන් බලපත්‍රයක් හෝ හැඳුනුම්පතක් තිබේ නම් එහි අංකය : ……………………………………………………

ලබාගත හැකි නම් විස්තරය සහ ඡායාරූපය (ඇමුණුම බලන්න) : ……………………………………………………

### 2. දෙමව්පියන්

2.1 මව : නම සහ මුල් නම් : ……………………………………

උපන් ස්ථානය හා දිනය : ……………………………

ජාතිය : ……………………………………………

වෘත්තිය : ……………………………………………

පුරුදු වාසස්ථානය : ……………………………………

ගමන් බලපත්‍රය හෝ හැඳුනුම්පතක් ඇත්නම් එහි අංකය : ……………………………

2.2 පියා : නම සහ මුල් නම් : ……………………………………

උපන් දිනය හා ස්ථානය : ……………………………

ජාතිය : ……………………………………………

## 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාල සම්මුතිය පනත

වෘත්තිය :..........................................................................

පුරුදු වාසස්ථානය : ...............................................

ගමන් බලපත්‍රය හෝ හැඳුනුම්පතක් ඇත්නම්, එහි අංකය :.........

..........................................................................

2. 3 විවාහ වූ දිනය හා ස්ථානය

**II (රැගෙන යාමට හෝ රඳවා තබා ගැනීමට පෙර ඇත්ත වශයෙන් භාරකාරත්වය ක්‍රියාත්මක කල) ඉල්ලා සිටින පුද්ගලයා හෝ ආයතනය**

3. නම සහ පළමු නම : ..........................................................

තනි පුද්ගල ඉල්ලුම්කරුවකුගේ ජාතිය : ...................................

තනි පුද්ගල ඉල්ලුම්කරුවකුගේ වෘත්තිය : ................................

ලිපිනය : ..........................................................................

ගමන් බලපත්‍රය හෝ හැඳුනුම්පතක් ඇත්නම් එහි අංකය :..................

..........................................................................

ළමයාට ඇති නෑකම : ..........................................................

නීති උපදේශකයකු ඇත්නම් ඔහුගේ නම සහ ලිපිනය :......................

..........................................................................

**III ළමයා සිටිනු ඇතැයි සිතනු ලබන ස්ථානය**

4. 1 ළමයා රැගෙන යාම හෝ රඳවා තබා ගනු ලැබීම කරන ලදැයි කියනු ලබන තැනැත්තා පිළිබඳ තොරතුරු :

නම සහ පළමු නම් : ..........................................................

උපන් දිනය හා ස්ථානය දන්නේ නම් ඒ විස්තර : ......................

ජාතිය දන්නේ නම් එය : ......................................................

වෘත්තිය : ..........................................................................

අවසන් වරට දැන සිටි ලිපිනය : ...........................................

ගමන් බලපත්‍රයක් හෝ හැඳුනුම්පතක් ඇත්නම් එහි අංකය : ...........

.....................................................................

ලබාගත හැකි නම් විස්තරයක් හා ඡායාරූපයක් :......................
(ඇමුණුම බලන්න)

4. 2 ළමයාගේ ලිපිනය

4. 3 ළමයා සිටින ස්ථානය පිළිබඳ අතිරේක තොරතුරු සැපයිය හැකි

වෙනත් තැනැත්තන් : ..................................................

.....................................................................

.....................................................................

IV අයුතු ලෙස රැගෙන යාම හෝ රඳවා තබා ගැනීමේ වේලාව, ස්ථානය, දිනය හා අවස්ථානුගත කරුණු :.........................................

.....................................................................

.....................................................................

V ඉල්ලුම්කරුගේ හිමිකම්පෑම පදනම් වී ඇති සිද්ධිමය හෝ නීතිමය හේතු.............................................................

.....................................................................

.....................................................................

VI විභාග වෙමින් පවතින සිවිල් නඩු කටයුතු :..........................

.....................................................................

.....................................................................

VII ළමයා ආපසු යැවිය යුත්තේ

(අ) නම සහ පළමු නම් :..........................................

උපන් දිනය හා ස්ථානය : ....................................

ලිපිනය : ................................................

දුරකථන අංකය : .........................................

2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනත

(ආ) ළමයා ආපසු යැවීම සඳහා ඇති වැඩ පිළිවෙළ :..............

.....................................................................

.....................................................................

VIII වෙනත් කරුණු :.....................................................

.....................................................................

.....................................................................

IX අමුණා ඇති ලේඛනවල ලැයිස්තුව* ....................................

.....................................................................

.....................................................................

.....................................................................

දිනය : ..........................

ස්ථානය : ..........................

.............................................................

ඉල්ලා සිටීමේ මධ්‍යම බලධරයාගේ හෝ ඉල්ලුම්කරුගේ අත්සන සහ/ හෝ මුද්‍රාව :

---

*උදා : භාරකාරත්වය හෝ ප්‍රවේශවීමේ අයිතිය සම්බන්ධයෙන් වූ අදාළ තීරණයේ හෝ ගිවිසුමේ සහතික පිටපතක් ; අදාළ නීතිය පිළිබඳ සහතිකයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් ; ඉල්ලුම්කරු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා මධ්‍යම බලධරයාට බලය පැවරීම පිළිබඳ ලේඛනයක්.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.